# බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III ශ්‍රේණියේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ (සීමිත)තරඟ විභාගය - 2025

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච.10/2025 අනුව රු.82150 – 10 x 2400 – 8 x 2940– 17 x 3900 -195970/ වේ. වැටුප් කේත අංකය SL 1 -2025 වේ.වැටුප් පියවර 01 පියවර වේ.

02. **සේවා කොන්දේසි :**

I. අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

II. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

03. **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී තනතුරෙහි මුළු පුරප්පාඩු 02 ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇත. 100% සීමිත පදනම මත බඳවා ගැනීමකි. මෙම සහකාර ප්‍රධාන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමකි. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

* **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025.07.25 දින වේ.**

04. **සුදුසුකම් :**

**4.I. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් -**

I. එක්සත් රාජධානියේ ගිනි ඉංජිනේරුවන්ගේ ආයතනයේ උපාධිත්ව විභාග සහතිකය (Graduteship Examination Certificate of the Institution Of Fire Engineers - UK)

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

4.2 සුදුසුකම්

i. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයක ගිනි නිවීම් සේවා ඒකකයක / දෙපාර්තමේන්තුවක ඉහත (i) හෝ (ii) සුදුසුකම් ලැබූ ගිණි භට හෝ ඊට ඉහළ තනතුරක වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියෙකු වීම.

හෝ

ii. තනතුරේ ස්ථිර කරන ලද වසර තුනක (03) සේවා කාලයක් ඇති ප්‍රාදේශීය ගිනි නිවීම් නිලධාරියෙකු වීම.

4.3. කායික සුදුසුකම් - තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

4.4. වයස් සීමාව - දැනටමත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

4.5. වෙනත් - තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය**2025.07.25** දින වේ.

## 05. බඳවා ගැනීමේ ක්‍රමය :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

## 06. I ලිඛිත විභාගය :

**ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ.**

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි නිවීම් සේවා ඉංජිනේරු, මෙහෙයුම් හා ගිනි සුරක්ෂිතතාව | පැය 03 | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂා හැකියාව | පැය 01 | 100 | 40 |

ii. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි නිවීම් සේවා ඉංජිනේරු, මෙහෙයුම් හා ගිනි සුරක්ෂිතතාව | **I.ගිනි ඉංජිනේරු විද්‍යාව**<br><br><u>යාන්ත්‍රික විද්‍යාව- **Mechanics**</u><br>• චලිතය පිළිබඳ නිව්ටන්ගේ නියමයන්, ඒ පිළිබඳ ගැටළු විසඳීම.<br>• වේගය, ප්‍රවේගය, ත්වරණය හා ගුරුත්වාකර්ෂණය පිළිබඳ ගැටළු විසඳීම හා අර්ථ දැක්වීම.<br>• ශක්ති සංස්ථිතික නියම හා ගැටළු විසඳීම.<br>• ඝර්ෂණය හා ගම්‍යතාවය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.<br><br><u>ද්‍රව විද්‍යාව - **Hydraulics**</u><br>• ඝනත්වය,සාපේක්ෂ ඝනත්වය හා පීඩනය<br>• වායුගෝලීය පීඩනය හා ඒ පිළිබඳ න්‍යාය ධර්ම (ගිනි නිවීම් සේවාවේදී අදාළ කර ගන්නා අවස්ථා සම්බන්ධයෙන්)<br>• ජල ශක්තිය හා කාර්යක්ෂමතාවය ගණනය කිරීම.<br>• පීඩන ශක්තිය, චාලක ශක්තිය බවට පරිවර්ථනය වීම පිළිබඳ අවබෝධය හා ජලනල භාවිතයේදී ඇති වන ප්‍රායෝගික ගැටළු පිළිබඳ අවබෝධය<br><br><u>විද්‍යුතය - **Electricity**</u><br>• විද්‍යුත් ධාරා ගමන් කිරීමට විද්‍යාත්මක විග්‍රහය<br>• Switch board, fuse board, circuits breakers පිළිබඳ අවබෝධය<br>• ඕම්ගේ නියමය හා ඒ පිළිබඳ ගැටළු විසඳීම.<br>• විද්‍යුතය භාවිතය,මෝටර් භාවිතය හා වියළි කෝෂ පිළිබඳ අවබෝධය<br>• Alternative and direct විද්‍යුත් ධාර පිළිබඳ අවබෝධය<br>• වෝල්ටීයතාවය<br>• ශක්තිය හා තාපය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම<br><br><u>තාපය - **Heat**</u><br>• විශිෂ්ට තාපය (Specific heat)<br>• ගුප්ත තාපය (Latent heat)<br>• ශක්ති පරිවර්තන නියම ගැටළු විසඳීම<br>• රේඛීය ප්‍රසාරණතාවය, ක්ෂේත්‍රවල ප්‍රසාරණතාවය හා පරිමා ප්‍රසාරණතාවය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම<br><br><u>විකිරණශීලීතාවය - **Radioactivity**</u><br>• විකිරණශීලීතාවය මූලධර්ම හා එහි ප්‍රතිවිපාක<br>• කිරණ වර්ග හඳුනා ගැනීම හා ඒවායේ ගති ලක්ෂණ<br>• ක්ෂයවීම හා අර්ධජීව කාලය පිළිබඳ අවබෝධය<br>• විකිරණ සුරක්ෂිතතාව |

රසායන විද්‍යාව - **Chemistry**

- පරමාණුක ව්‍යුහය හා මවුලික භාරය, පරමාණුක භාරය හා වාෂ්ප ඝනත්වය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.
- රසායනික සංයෝග, සංයුජලතාවය පිළිබඳ දැනුම
- තුලිත රසායනික සමීකරණ හා Stoichiometric Condition හා රසායනික සූත්‍ර පිළිබඳ අවබෝධය
- ජ්වලන අංකය, දහන අංකය හා ස්වයං දහන අංකය පිළිබඳ සම්බන්ධතාවයන් දැන ගැනීම හා අවබෝධය
- දාම ප්‍රතික්‍රියා හා ගිනි නිවීම පිළිබඳ විද්‍යාත්මක විචාරණය

**II. ගිනි නිවීම් සේවා මෙහෙයුම්**

- ගිනි නිවීම් තාක්ෂණ - Fire Fighiting Technology
- පාලනය හා විධානය - Command & Control
- මෙහෙයුම් භූමි සන්නිවේදන ක්‍රම - Fire Ground Communication
- සිද්ධීන් පාලනය හා විධානය පිළිබඳ ක්‍රමවේදයන් - Incident command & Control
- මෙහෙයුම් භූමි සුරක්ෂිතතාවය - Fire ground Safety
- විශේෂිත අවදානම් ස්ථාන හා ද්‍රව්‍ය පිළිබඳ අවබෝධය - Specific hazadours premises & materials
- කර්මාන්ත ආශ්‍රිත ගිනි මෙහෙයුම් හා පද්ධති පිළිබඳ අවබෝධය - Industrial Premisses
- ස්වභාවික විපත් හා ගොඩනැගිලි කඩා වැටීම් හා ගංවතුර බලපෑම් - Natural disasters
- සන්නිවේදන හා කණ්ඩායම් ස්ථානගත කිරීම-- (Communication & Mobilisation)
- පොම්ප හා ජල උරාගන්නා උපකරණ - (Pump & Primers)
- මෙහෙයුම් භූමියක පොම්ප ස්ථාන ගත කිරීම
- නඩත්තු කටයුතු
- ගිනි නිවීම් සේවා වාහන - (Fire Service Vehicles)
- ගිනි නිවීම් සේවා උපකරණ - (Fire Service Equipment)
- ගිනි නිවන පෙන හා මාධ්‍ය වර්ග -(Fire Fighing Foam & Other media)
- ගිනි නිවීම් සේවා ඉනිමං - (Fire Service Ladders)
- විශේෂිත මෙහෙයුම් (රසායනික ද්‍රව්‍ය ඉහිරීම කාන්දුවීම වැනි සිද්ධීන් )- (Special Operations – Chemical Incidents)
- මුදාගැනීමේ මෙහෙයුම් හා උපකරණ -(Rescue Operations & Equipment)
- මෙහෙයුම් අවස්ථාවලදී තීරණ ගැනීම් ක්‍රමවේදය - (Dynamics Decision Making Process)

| | |
|---|---|
| | III.ගිනි සුරක්ෂිතතාව<br>• ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා ගිනි අවස්ථාවන්හි ඒවායේ හැසිරීම හා අවදානම් තත්ත්වය - Building construction<br>• ස්ථාවර ගිනි නිවීම් පද්ධති - Fixed Installations<br>• ගිනි ප්‍රවේශම් හා භාවිතය පිළිබඳ දැනුවත්භාවය -Fire Safety Practices<br>• ගිනි අනතුරු ඇති වීමට හේතු සෙවීම හා නිවාරණ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ අවබෝධය<br>• Public awareness - මහජනයා ගිනි අනතුරෙන් මුදවා ගැනීමේ ක්‍රම වේදයන්<br>• දැනුවත් කිරීම |
| ඉංග්‍රීසි භාෂා හැකියාව | වාර්තා රචනය **(Report Writting)**<br>• තොරතුරු සොයා ගැනීම - Findings<br>• නිගමනයන් - Conclusion<br>• නිර්දේශයන් ඉදිරිපත් කිරීම - Recommendations<br>• ඉහළ කළමනාකාරිත්වය වෙත වාර්තාව ඉදිරිපත් කිරීම - Presenting to Senior Management<br>අවබෝධය<br>• වාක්‍ය කාණ්ඩයක් හෝ ඡේදයක් කියවා දළ අදහස ලිවීම<br>• Write a short note / summary<br>• අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම(Answer the given Question)<br>ව්‍යාකරණ අවබෝධය<br>• රචනා ලිවීම - Essay Writing<br>• රාජකාරී ලිපි ලිවීම - Formal letter Writting<br>• විද්‍යුත් තැපැල් ලිවීම - Email Writting<br>• වාක්‍ය කාණ්ඩ ලිවීම - Grammer Evaluation |

## 08. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

- බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද තහවුරු කර ගැනීම හා අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව තහවුරු කර ගැනීම සඳහා පමණක් පැවැත්වේ.
- සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලැබේ.
- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ලැබේ.

09.i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජකාරී විෂයට අදාළව අසනු ලබන ප්‍රශ්න සඳහා | 40 | 40 |
| සේවා කාලය තුළ ඇගයීම් හා ආයතනයට දක්වන ලද දායකත්වයන් සඳහා | 30 | |
| සේවා පරිසරයෙන් බැහැර ජාතික මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් | 25 | |
| පෞරුෂත්වය | 05 | |
| එකතුව | 100 | |

10.

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජකාරී විෂයට අදාළව වාචික ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.(එක් පිළිතුරකට ලකුණු 08 බැගින්)<br>• ගිනි නිවීම් සේවා ස්ථාන පාලනය සහ මානව සම්පත් කළමනාකරණය (Fire Station Administration & Human Resource Management)<br>• මෙහෙයුම් ස්ථාන පාලනය (Incident Command- Eg : Fire Rescue, Urban Search & Rescue, Road & Railway Traffic Incident)<br>• ගිනි නිවාරණ සැලසුම් හා ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ විග්‍රහයන් (Fire Prevention & International Standards)<br>• අන්ත්‍රාකාරී ද්‍රව්‍ය අන්තර්ගත සිද්ධීන් සහ මහජන සුරක්ෂිතතාවය (Hazardous Material Involved Incident & Public Safety)<br>• මෙහෙයුම් කණ්ඩායම් සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය (Operation Crew 's Health & Safety) | 40 | 40 |
| සේවා කාලය තුළ ඇගයීම් හා ආයතනයට දක්වන ලද දායකත්වයන් සඳහා<br>(එක් දායකත්වයකට ලකුණු 06 බැගින් උපරිමය අවස්ථා 05 ක් සඳහා)<br>(සාමාන්‍ය රාජකාරිවලට පරිබාහිර විෂයට අදාළ සුවිශේෂී කාර්යයන් / ජාතික වශයෙන් ඇතිවන ආපදා තත්ත්වයන් හිදී දක්වන සුවිශේෂී දායකත්වයන්) | 30 | |

| | | |
|---|---|---|
| සේවා පරිසරයෙන් බැහැර ජාතික මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>• සම්පත් දායකත්වය (රජයේ විශ්ව විද්‍යාල, රජයේ අනුබද්ධ උසස් අධ්‍යාපන තාක්ෂණ ආයතනවල)<br>• රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන වෘත්තීය සංවර්ධන පාඨමාලා සහතික පත්‍රය (පැය 50 ට වැඩි)<br>• සෞඛ්‍ය හා ප්‍රවේශම පිළිබඳ උසස් පාඨමාලා සහතික | 25 | |
| පෞරුෂය | 05 | |
| **එකතුව** | **100** | |

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**11. විභාග ගාස්තු :**

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 1200/=කි. විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත් සභාව තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

**12. විභාගයට ඇතුලත්වීම :**

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විභාග කටයුතු පිළිබඳ රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට සිදුවනු ඇත.

**13. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I වලංගු ජාතික හැඳුනුම්පත

Ii වලංගු විදේශ ගමන් බලපත්‍රය

**14. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඔහු / ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය විසින් වුවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 58 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**15. අයදුම් කිරීමේ ක්‍රමය :**

අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A4 ප්‍රමාණයේ පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2025.07.25** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **" ලේකම්, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැඟිල්ල,නාවල පාර, රාජගිරිය"** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය-2025 "** යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

I. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

II. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

දු.ක. - 011 2879614
ෆැක්ස් - 011 2879512
ඊ-මේල් - ppscwprec@sltnet.lk

# ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය - 2025**

විභාග අංකය ☐

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E
☐

01. **පුද්ගලික තොරතුරු**

1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -.......................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
.......................................................................................................................................
(උදා: H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-
...........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
.......................................................................................................................................
.......................................................................................................................................

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්)
.......................................................................................................................................
.......................................................................................................................................

2.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:

✓ සිංහලෙන්/ දෙමළෙන්-
.......................................................................................................................................

✓ ඉංග්‍රීසි කැපිටල් අකුරින්-
.......................................................................................................................................

2.3 දුරකථන අංකය:

කාර්යාල

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

- විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

03. ස්ත්‍රී/ පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ √ යොදන්න)

පුරුෂ [ ] ස්ත්‍රී [ ]

04. 4.1 විවාහක/අවිවාහක බව- (විවාහක-2, අවිවාහක- 1) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2 උපන් දිනය වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: ................ මාස............ දින .........

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 4.1.(i) හි සඳහන් කර ඇති පරිදි එක්සත් රාජධානියේ ගිනි ඉංජිනේරුවන්ගේ ආයතනයේ උපාධිත්ව විභාග සහතිකය (Graduateship Examination Certificate of the Institution Of Fire Engineers - UK) පිළිබඳ විස්තර (උපාධි සහතිකයේ හා විස්තරාත්මක සහතිකයේ ( Detailed Certificate) පිටපත් ඇමිණිය යුතුයි)

I. ආයතනයේ නම :........................................................................................................
II. උපාධිය:...................................................................................................
III. උපාධි සහතිකය වලංගු දිනය: ...........................................................................

5.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 4.1.(ii) අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිළිබඳ විස්තර

i. ලබා ඇති උපාධිය ...............................................................................................
ii. උපාධියේදී හදාරණ ලද විෂයයන් ...........................................................................
iii. විශ්ව විද්‍යාලයේ නම ..........................................................................................
iv. උපාධි සහතිකය වලංගු දිනය ...............................................................................

06. දැනට දරණ තනතුරට අදාළ තොරතුරු

6.1 දැනට දරණ තනතුර: .........................................................................................

6.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද,අනියම්ද යන්න : ..........................................

6.3 එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................................

6.4 සේවය ස්ථිර කල දිනය : ..................................................................................

6.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පාලන චක්‍රලේඛ 04/2021 අනුව ඔබ විනය ක්‍රියාමාර්ගයට ලක් වී තිබේද? ඔව්/ නැත

6.6 ඉහත 6.5 ට පිළිතුර " ඔව් " නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න .
..........................................................................................................................

6.7 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වී ඇත්නම් එම දිනය : .................

6.8 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..............................................................

6.9 වැටුප් බණ්ඩය: ..............................................................

07. බස්නාහිර පළාත්, පළාත් පාලන ආයතනයක ගිනි නිවීමේ සේවා ස්ථානයක /දෙපාර්තමේන්තුවක ගිනි භට හෝ ඊට ඉහල තනතුරක වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය පිළිබඳ විස්තර

i. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..............................................................

ii. වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ........................................

iii. වසර 10 සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? ..................................

iv. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද? ..............................................................

v. ඉහත iv සඳහා පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.......................................... ..............................................................

08 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..............................................................

ලදුපත් අංකය - ..............................................................

දිනය - ..............................................................

| |
|---|
| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න |

(ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

09 <u>අයදුම්කරුගේ සහතිකය</u>

..............................................................................................................

.............................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා වන පත් කිරීම සඳහා වු මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ..........................................

..................................................

අයදුම්කරුගේ අත්සන

10 **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

( අනවශ්‍ය වචන කපා හරින්න)

..............................................................................................................................................මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ......................................දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ......................................... තනතුරක සේවය කරන බවත්..................................දින සිට සේවය ස්ථිර කර ඇති/ නැති බවත් .......................... දිනට ගිනි බට හෝ ඊට ඉහළ තනතුරක වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර/ තනතුරේ ස්ථිර කරන ලදවසර තුනක (03) ඇති බවත් එම කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන ඇති/නැති බවත් , වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ ඇති බවත් සහතික කරමි.

2. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාල බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය ................................

..................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ............................................ මහතා/මිය/මෙනවිය සියළු සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් ඔහු /ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවද ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය .....................................

ලිපිනය ....................... ............. ..............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**12. ප්‍රධාන ලේකම් /අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය**

ඉහත අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය .................................... ..................................................................

ප්‍රධාන ලේකම්/අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව

ලිපිනය..............................